**තංගල්ල නගර සභාව**
**හම්බන්තොට දිස්ත්‍රික්කය**
------------------------------

**1 මූල්‍ය ප්‍රකාශන**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 මැයි 07 දිනද , ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 ජූලි 14 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 අගෝස්තු 13 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර , මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 දිනට තංගල්ල නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඉකුත් වසරේ අප්‍රේල් සිට දෙසැම්බර් මස දක්වා තංගල්ල මූලික රෝහලේ පවිත්‍රතා සේවා සැපයීම වෙනුවෙන් සභාව වෙත වැඩියෙන් මුදල් ගෙවීම් කිරීම නිසා එකතුව රු. 489,333 ක් මෙම වසරේ ගෙවීම් කටයුතු සඳහා හිලව් කර තිබූ අතර එම වටිනාකම් සමාලෝචිත වසරේ ආදායමට ගෙන නොතිබුණි.

(ආ) අංක 01/2010 දරන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛය ප්‍රකාරව 2010 දෙසැම්බර් 31 දිනෙන් පසු මධ්‍යම රජයෙන් ප්‍රතිපූර්ණයවන මුද්දර ගාස්තු පළාත් සභාව වෙත ගෙවීම්කර ඒ හරහා පළාත් පාලන ආයතන වෙත ලැබීමට සලස්වන බව අංක PFD/ACC/06 මූ.ගා. හා 2012 ජූලි 23 දිනැති රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් සභාව වෙත ලිපියක් මගින් දැනුම් දී තිබූ අතර සභාව විසින් ඉන්පසුවද 2011 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා කාලයට අදාලව මධ්‍යම රජයෙන් ප්‍රතිපූර්ණය විය යුතු මුද්දර ගාස්තු ලෙස එකතුව රු. 750,790 ක් ණයගැති වෙන්කිරීම් කර තිබුණි.

(ඈ) ඉකුත් වර්ෂයේ අනුමතවූ කර්මාන්ත 28 ක් වෙනුවෙන් ගෙවීම් වාර්තා අනුව 2014 දෙසැම්බර් 31 දිනට ප්‍රතිපූර්ණය විය යුතු වටිනාකම රු. 13,664,063 ක් වුවද ණයගැතියන් යටතේ වෙන්කර තිබුණේ රු. 13,766,167 ක් ලෙස රු. 102,104 ක් වැඩියෙනි. සමාලෝචිත වසරේ අවසානයට වෙන්කර තිබූ කර්මාන්ත ණයහිමි වටිනාකමද එම ප්‍රමාණයෙන් වැඩියෙන් ගිණුම්ගත වී තිබුණි.

(ඇ) 2009 හා 2010 වර්ෂවල අනුමත කර ඉටුකරනු ලැබූ රු. 157,115 ක්වූ කර්මාන්ත දෙකක් සඳහා සියළුම මුදල් සභාව වෙත ලැබී තිබුණද, 2014 දෙසැම්බර් 31 දිනට එම මුදල තවදුරටත් අයවිය යුතු මුදලක් ලෙස ණයගැති වටිනාකම තුළ ඇතුළත්කර තිබුණි.

(ඉ) සභාව විසින් පළාත් පාලන විශ්‍රාම වැටුප් දායක අරමුදල් වෙනුවෙන් 2014 දෙසැම්බර් 31 දිනට රු. 4,375,808 ක් ණයහිමි වෙන්කිරීම්කර තිබුණද , පළාත් රාජ්‍ය සේවා විශ්‍රාම වැටුප් දායක බිල්පත් හා ගෙවීම් විස්තර අනුව එය රු. 4,431,084 ක් විය. ඒ අනුව රු. 55,276 ක් අඩුවෙන් වෙන්කිරීම්කර තිබුණි.

(ඊ) සමාලෝචිත වසරේ දරන ලද එකතුව රු. 488,692 ක්වූ වියදම් ප්‍රාග්ධනිතකර නොතිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 951,312 ක්වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු. 812,559 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත්කර තිබූ ඇස්තමේන්තුගත ආදායම් , තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය ආදායම | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු. '000 | රු. '000 | රු. '000 |
| i. | වරිපනම් හා බදු | 2,700 | 2,541 | 2,060 |
| ii. | බදුකුලී | 8,436 | 5,860 | 2,676 |
| iii. | බලපත්‍ර ගාස්තු | 446 | 344 | 32 |
| iv. | වෙනත් ආදායම් | 94,754 | 48,062 | 3,813 |

### 2.2.2 වරිපනම් බදු

2014 දෙසැම්බර් 31 දිනට හිඟ වරිපනම් බදු මුදල රු. 2,060,122 ක් වූ අතර ඉන් රු. 1,572,207 ක් ඉකුත් වර්ෂයට අදාල විය. එය මුළු හිඟයෙන් සියයට 76 ක් පමණ වූ අතර නගර සභා ආඥා පනතේ 170(අ) ප්‍රකාරව මෙම හිඟ අයකර ගැනීමට කටයුතුකර නොතිබුණි.

### 2.2.3 බදුකුලී

2014 දෙසැම්බර් 31 දිනට හිඟ බදු කුලී ආදායම රු. 2,675,838 ක්වූ අතර ඉන් රු. 2,284,842 ක් සභාවට අයත් තානායම වෙනුවෙන් අයවිය යුතු ආදායම් විය. එය මුළු හිඟයෙන් සියයට 85 ක් පමණ වූ අතර මෙම හිඟ බදු මුදල් අයකර ගැනීම සඳහා නගර සභා ආඥා පනතේ 170 අ (1) වගන්තිය ප්‍රකාරව කටයුතුකර නොතිබුණි.

### 2.2.4 නෛතික ක්‍රියාමාර්ග

සමාලෝචිත වර්ෂය ආරම්භයට හිඟ ආදායම් රු.3,797,932 ක් අයකර ගැනීම සඳහා නඩු පවරා තිබූ අතර වර්ෂය තුල මෙම මුදලින් රු. 120,000 ක් පමණක් අයවී තිබුණි. වර්ෂය අවසානයට තවදුරටත් අයවිය යුතු මුදල රු. 3,677,932 ක් විය.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

**(අ) බහු කාර්යය ජංගම කුටි**

පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශයෙන් 2013 අයවැය යෝජනා මගින් ක්‍රියාත්මක වූ පළාත් වල දිළිදුකම අවම කිරීමේ සංවර්ධන වැඩ සටහන යටතේ රු.270,000 ක් වටිනා කැනපි ආවරණ කුටි 10 ක් සභාවට ලබාදී තිබූ නමුත් කුටි 05 ක් පමණක් ඉන්වෙන්ට්‍රිගතකර තිබුණි. 2015 ජුලි 07 දින සිදු කළ භෞතික පරීක්ෂාවේ දී එම කුටි 05 ද සභාව සතුව නොතිබූ අතර ඉන්වෙන්ට්‍රි ගත නොකළ කුටි 05 සම්බන්ධව කිසිදු තොරතුරක් විගණනයට ඉදිරිපත් නොකෙරිණි.

**(ආ) භාණ්ඩ ඌනතා**

2015 ජුලි 07 දින සිදු කළ භෞතික පරික්ෂාවේදී ගිනි නිවීමේ ඒකකය සතුව ඇති අංක LW 0344 දරන ගිලන් රථයේ සහ අංක LE 1134 දරන ලොරි රථයේ ඉන්වෙන්ට්‍රි ලේඛනයේ ඇති උපකරණ කොටස් 03 ක් භෞතිකව නොපැවති බව නිරික්ෂණය විය.

**3.2 කොන්ත්‍රාත් පරිපාලනය**

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) දංකැටිය වීර මාවත

ඇස්තමේන්තුගත මුදල රු. මිලියන 40 ක් වූ දංකැටිය වීර මාවත හරහා දංකැටිය මාර්ගයට සම්බන්ධවන විකල්ප මාර්ගය ඉදිකිරීමේ කර්මාන්තය 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.2 වගන්තිය ප්‍රකාර ජාතික තරගකාරී ලංසු කැඳවීම් කර කොන්ත්‍රාත්කරුවෙකු තෝරා ගෙන ඉදිකිරීම් කටයුතු සිදු කළ යුතු වුවත් එයට පටහැනිව මෙම කර්මාන්තය රු. 1,000,000 ක් බැගින් වූ කොටස් 40 කට වෙන්කර අනුමත සමිති වෙත පවරා ඉටුකරවා ගෙන තිබුණි.

මාර්ගයේ ආරම්භක හා අවසාන ස්ථානවලින් වීරකැටිය ප්‍රධාන මාර්ගයට හෝ තිස්සමහාරාම ප්‍රධාන මාර්ගයට සම්බන්ධ වීමක් සිදුව නොතිබුණි. එම නිසා විශාල පිරිවැයක් දරා මෙම මාර්ගය ඉදිකර තිබුණද, එහි ප්‍රයෝජනවත්භාවය පිළිබද ගැටළු සහගත තත්ත්වයක් විය.

(ආ) කර්මාන්ත භෞතික පරීක්ෂණය

---

සභාව විසින් ක්‍රියාත්මකකර තිබූ කර්මාන්ත කිහිපයක් සම්බන්ධයෙන් 2015 ජුනි 24 දින සිදු කළ භෞතික පරීක්ෂාවේදි අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

( I ) පඤ්ඤාවාස මාවතේ පිහිටි I වන අතුරු මාර්ගය පැති බැම්ම සමඟ ඉදිකිරීම I,II හා III අදියර

---

ඇස්තමේන්තුගත මුදල රු. 3,000,000 ක්වූ මෙම කර්මාන්තය අනුමත සමිතියක් වෙත පවරා ඉටුකරවාගෙන එකතුව රු. 2,894,016 ක ගෙවීම් වාර්තා සකස් කර ගෙවීම් කර තිබුණි.

- ගෙවීම් වාර්තාවේ මෙම මාර්ගයේ දෙපැත්තෙහි පැති බැම් ඉදිකිරීම වෙනුවෙන් එකතුව රු. 1.466,136 ක මුදලක් වැයකර තිබූ අතර මාර්ගයේ වම් පැත්තේ මාර්ගය නිම කිරීම සඳහා කොන්ක්‍රීට් ගැට් යෙදිමට හැකියාව තිබියදී එසේ නොකර පැතිබැම්මක් ඉදිකර තිබුණි. ඉදිකර තිබූ පැති බැම්ම පෞද්ගලික ඉඩම් හිමියකුගේ ඉඩම වටා ඉදිකර ඇති බව ද මෙම පැති බැම්ම මත පෞද්ගලික ඉඩම් හිමියා විසින්, පැති බැම්ම තම ඉඩම තුළට සිටින සේ ඒ මත තාප්පයක් ඉදිකර තිබූ බවද නිරීක්ෂණය විය.

- මාර්ගයේ දකුණු පැත්තේ පැති බැම්ම ඉදිකිරීමේදී පෞද්ගලික ඉඩම් හිමියෙකුගේ ඉඩමේ පසුපස කොටසද ආවරණය වන පරිදි ඉදිකිරීම් කර තිබුණි.

- කොන්ක්‍රීට් කුට්ටි ගල් අල්ලා මාර්ග තලය සකස් කිරීමේ දී පෞද්ගලික ඉඩම් හිමියකුගේ ඉඩමේ ගේට්ටුව දක්වාම රජයේ මුදල් භාවිතාකර කොන්ක්‍රීට් කුට්ටි ගල් අල්ලා මාර්ගය සකස්කර දී තිබූ අතර පදිංචිකරුවෙකු නොමැති හා වැඩ නිම නොකරන ලද නිවාසයක් ඉදිරිපිට කොටසද කොන්ක්‍රීට් කුට්ටි ගල් අල්ලා සකස්කර දී ඇති බවද එම නිවස ඉදිරිපිටින් මාර්ගය අවසන් වන බවද නිරීක්ෂණය විය.

ඉදිපොකුණගොඩ උතුර නගර නිවාස ප්‍රධාන මාර්ගය I අදියරඉදිපොකුණගොඩ බෙලිඅත්ත පාර නගර නිවාස පිවිසුම් මාර්ගය I අදියර යන මාර්ග සංවර්ධනය කිරීම

-----------------------------------------------------------------------------------------

මීටර් 87 ක් දිගට කොන්ක්‍රීට් කුට්ටි ගල් අල්ලා සංවර්ධනය කිරීම සඳහා මෙම කර්මාන්ත දෙක අනුමත සමිතියක් වෙත පවරා ඉටුකරවාගෙන එකතුව රු. 999,454 ක ගෙවීම් වාර්තා සකස් කර ගෙවීම් කර තිබුණි. මුළු දුර මීටර් 87 ක් දිග මෙම මාර්ගයේ පතුලට මීටර් 41 දිගට හා අඟල් 3 ක් ඝනකමට ABC මිශ්‍රණය යෙදූ බව දක්වමින් එකතුව රු. 61,551 ක් ගෙවීම් කර තිබුනද මාර්ගයේ ස්ථාන 03 ක් කොන්ක්‍රීට් කුට්ටි ගල් ගලවා පරීක්ෂා කළ අතර එම ස්ථාන වල ගල් කුඩු පමණක් තිබූ අතර ABC මිශ්‍රණය යොදා නොතිබුණි.

**4. පද්ධති හා පාලන**

**------------------------**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) වාහන නඩත්තුව හා පාලනය

(ඈ) සේවක කළමනාකරණය